**06-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සැබෑ ගැලවීමේ හමුදාව වෙමින් සෑම කෙනෙක්ම මෙම පාප දේශයෙන් පුන්‍ය දේශයට ගෙන යන්න. සෑම කෙනෙකුගේම ගිලීගිය බෝට්ටුව එතෙර කරවන්න.

**ප්‍රශ්නය:** හැම දරුවෙකුගේම බුද්ධියේ පිළිවෙලින් ඇති පැහැදිලි ශ්‍රද්ධාව කුමක්ද?

**පිළිතුර:** පාරිශුද්ධකරුවාණන් වන අපගේ අතිශයින් ආදරවන්ත බාබා, අපට දෙව්ලොව උරුමය දෙන බව පිළිබඳ පැහැදිලිතාවයයි. මෙය ඇත්තේ එක් එක් දරුවාගේ බුද්ධියේ ප්‍රමාණය අනුවයි. සම්පූර්ණ ශ්‍රද්ධාව තිබියදීත් මායාව ඉදිරියේ ඔවුන් පරම පියා අමතක වී අසමත් බවට පත් වේ. මේ ශ්‍රද්ධාව ඇති අය පාරිශුද්ධත්වයට පත් වීමට උත්සාහ දරයි. ඔවුන්ගේ බුද්ධිය තුළ පවතින්නේ ඔවුන් ගෙදර යා යුතු බවයි.

ඕම් ශාන්ති. සුමිහිරි ආදරණීය බොහෝ කාලයක් නැතිවී සිට දැන් හමුවූ දරුවන්ට සුබ උදෑසනක් වේවා. ඔබ දරුවන් දන්නවා, සත් යුගයේ දී සෑම උදයක්ම ඉතා හොඳ සුබ බව. හැම දහවලක්ම සුබයි. හැම දෙයක්ම සුබයි. සුබ රාත්‍රියක් - හැම දෙයක්ම සුබයි. මෙහි, උදෑසන ද රාත්‍රිය ද එසේ නැත. රාත්‍රිය වඩාත් නරකයි. ඉතින් වඩාත්ම හොඳ කුමක්ද? අම්රිත් වේලා නමින් හඳුන්වන උදේ පාන්දරයි. ඔබේ හැම මොහොතක් ම හොඳයි. ඔබ දරුවන් දන්නවා මෙකල ඔබ යෝගේෂ්වර සහ යෝගීෂ්වරී බව. ඔබේ පියා වන පරමාත්ම දෙවියන් පැමිණ ඔබට යෝගා උගන්වයි. එනම්, ඔබ දරුවන් යෝග වන්නේ පරමාත්්ම දෙවියන් සමඟයි. ඔබ යෝගේෂ්වර බවට පත් වීම මඟින් ඥානයේ දෙවියන් වන පරම පියා ගැන දැනගෙන ඇත. ඔබේ සම්බන්ධය වූ යෝගාව පියා සමඟ වන අතර ඔහු පැමිණ මුළු ලෝක චක්‍රය පිළිබඳ ඥානය දීම තුළින් ඔබ ඥානයේ දෙවිවරු බවට පත් කරවයි. පරම පියා වන පරමාත්ම දෙවියන් පැමණ ඔබ දරුවන්ට ඥානය සහ යෝගාව උගන්වයි. කුමන දෙවියන්ද ඒ? අශරීරික පරම පියාය. ඔබ දැන් සැමදේම බුද්ධියෙන් කළ යුතුය. ගුරුන්ට බොහෝ අදහස් ඇත. සමහරු ඔබට කියන්නේ ක්‍රිෂ්ණා සමඟ යෝග වන ලෙසත් ක්‍රිෂ්ණාගේ පිංතූරය තබා ගන්නා ලෙසත්ය. එවැනි කෙනෙක් නම් සායි බාබාය. තව කෙනෙක් නම් මහාඍෂි බාබාය. මුස්ලිම්වරුන්ට සමහර අය බාබාය. සමහරුන්ට පාසීන් බාබාය. ඔවුන් දිගටම හැම කෙනෙකුටම බාබා කියයි. ඔවුන් මෙසේ කියයි සැමම දෙවියන්ය. ඔබ දැන් තේරුම් ගෙන සිටිනවා මනුෂ්‍යයින්ට දෙවියන් විය නොහැකි බව. ලක්ෂ්මි හා නාරායනටද දෙවියන් හා දේවීන් කිව නොහැකිය. දෙවියන් කිව හැක්කේ අශරීරික කෙනාට පමණි. ඔහු වූ කලී ජීවාත්ම සත්තාවන් වන ඔබ සැමගේ පරම පියාය. ඔහුට කියන්නේ ශිව බාබා කියාය. ඔබ උපතක් උපතක් පාසා ආධ්‍යාත්මික කණ්ඩායම් වල පසුපස ගොස් ඇත. එහි නියතයෙන්ම සන්‍යාසී කෙනෙක් හෝ මුණිවරයෙක් පණ්ඩිතයා ව සිටී. ඔවුන් තේරුම් ගන්නේ ඔහු ගුරු ලෙස වන අතර ඔහු ඔවුන්ට ආගමික කතා කියා දෙයි. සත් යුගයේ දී ආගමික කතා නැත. පරම පියා මෙහි සිට මෙසේ විස්තර කරයි 'දෙවියන්' හෝ 'ඊෂ්වර' කීමෙන් කිසිඳු සුමිහිරි බවක් අත්විඳිය නොහැකිය. ඔහු පරම පියා වන අතර ඔහුට 'බාබා' යැයි කීමෙන් සබඳකම සම්පූර්ණ වෙයි. ඔබ දන්නවා දෙව්ලොව සතුට ඔබට ලබා දෙන මමා හා බාබාගේ දරුවන් බවට ඔබ පත්වන බව. මනුෂ්‍යයින් දෙවියන් බවට පත් වන හෝ අපායේ වැසියන් දෙවියන් බවට පත් වන වෙනත් ආධ්‍යාත්මික කණ්ඩායමක් නැත. ඔබට දැන් සත්‍ය වූ පරම පියාගේ ආශ්‍රයත් අන් සියලුම අයට මිත්‍යාවේ ආශ්‍රයත් ඇත. මෙසේ ගැයේ සත්‍යයේ ආශ්‍රය ඔබ එගොඩ කරවන අතර භෞතික ආශ්‍රය ඔබව ගිල්වා දමයි. පරම පියා මෙසේ කියයි ජීවාත්ම සත්තා විඥානයට පත් වන්න. ශරීරයේ සිහිය හලා දමන්න. මම ජීවාත්ම සත්තාවන් වන ඔබට උගන්වමින් සිටිමි. උත්තරීතර ජීවාත්මය පැමිණ ඔබ ජීවාත්මයන්ට මෙම ආධ්‍යාත්මික ඥානය දෙයි. අන් හැම භක්ති මාර්ගයයි. එය ඥාන මාර්ගය නොවේ. පරම පියා මෙසේ කියයි මම සියලු වේද සහ ආගමික ග්‍රන්ථත් ලෝකයේ මුල, මැද, අගත් දනී. මම ඒ සියල්ලේ අධිකාරී වෙමි. ඒ මිනිසුන් භක්ති මාර්ගයේ අධිකාරීන්ය. ඔවුන් බොහෝ පොත් පත් ආදිය ඉගෙන ගන්නා අතර ඒවායේ අධිකාරීන් වේ. පරම පියා පැමිණෙන්නේ ඔබට සත්‍ය කියා දීමටයි. ඔබ දැන් දන්නවා සත්‍යයේ ආශ්‍රය ඔබව එතෙර කරවන අතර මිත්‍යාවේ ආශ්‍රය ඔබව ගිල්වා දමන බව. පරම පියා ඔබ දරුවන් තුළින් භාරතය ගලවා ගනී. ඔබ වූ කලී ආධ්‍යාත්මික ගැලවීමේ හමුදාවයි. පරම පියා මෙසේ කියයි දෙව්ලොව බවට පත් වී තිබුණු භාරතය දැන් අපාය වී ඇත. එය ගිලී ඇති අතර ඒ සාගරයෙන් නොවේ. ඔබ සතෝප්‍රධාන් බවින් තමෝප්‍රධාන් බවට පත් වී ඇත. සත් යුගය සහ ත්‍රේත යුගය සතෝප්‍රධාන්ය. මේ විශාල දුම් නැවකි. ඔබ එහි වාඩි වී සිටී. සියලු දෙනාම පාපකාරී නිසා මෙය පාපකාරී ලෝකයකි. සත්‍ය නම්, සියලුම දෙනාට ගැලවීම ලබා දෙන කෙනා වන්නේ එකම

සත්ගුරු පමණි. කිසිවෙක් ඔහු නොහඳුනයි. ඔවුන් සැම විට කියන්නේ මෙසේය ඕ දේව පියාණනි! ඔවුන් කිසිවිට මෙසේ නොකියයි ආගමික ගුරුවරයා වන දෙවි පියාණනි! නැත. ඔවුන් කියන්නේ පරම පියා කියා පමණි. ඔහු පාරිශුද්ධකරුවාණන් ද ගුරු ද වෙයි. පාරිශුද්ධකරුවා සහ සියලු දෙනාගේ ගැලවුම්කරුවා වන්නේ එකම පියාය. කිසිම මනුෂ්‍යයෙකුට ගැලවුම්කරුවා හෝ අපිරිසිඳු ලෝකය පිරිසිඳු කරන්නා විය නොහැකියි. පරම පියා මෙසේ කියයි එතරම්ම අපිරිසිඳු බවත් දූෂණයත් ඉහවහා ගොස් ඇත! මට දැන් ඔබ මව්වරු සහ කුමාරීන් මඟින් හැම කෙනෙක් ම එසවිය යුතුව ඇත. බ්‍රහ්ම කුමාරීන් සහ කුමරුන් වන ඔබ සියලු දෙනා සහෝදරයින් සහ සහෝදරියන්ය. නැත්නම්, සීයාගේ උරුමය ලබන්නේ කෙසේද? ඔබ දිව්‍ය රාජ්‍යය වන පියාගේ උරුමය පරම්පරා 21 කට ලබයි. ඉපයීම ඒ තරමම විශාලය! මෙය සැබෑ පරම පියාගේ සැබෑ ආදායමයි. පරම පියා වූ කලී පියාද ගුරුවරයාද සත්ගුරුද වෙයි. ඔහු අපට සියලු දේ ප්‍රායෝගිකව පෙන්වා දෙයි. මෙහිදී ගුරු නැති වූ විට ගෝලයාට අසුන හිමි නොවේ. ඒ ගුරුන් භෞතිකය. මේ කෙනා ආධ්‍යාත්මික ගුරුය. මෙය ඉතා පැහැදිලිව තේරුම් ගත යුතුය. මෙය ඉතා නව්‍ය වූ යමකි. ඔබ දන්නවා මෙය උගන්වන්නේ මනුෂ්‍යයෙකු නොවන බව. පාරිශුද්ධකරුවා සහ ඥාන සාගරය මෙම ශරීරය තුළින් අපට උගන්වයි. ඔබේ බුද්ධිය යැවෙන්නේ ශිව බාබා වෙතයි. අනෙක් ආධ්‍යාත්මික කණ්ඩායම් වලදී ඔබේ බුද්ධිය යන්නේ මනුෂ්‍යයෙකු වෙතයි. ඒ සියල්ල භක්ති මාර්ගයයි. ඔබ දැන් මෙසේ ගයයි මගේ මවත් පියත් ඔබ වන අතර අප ඔබේ දරුවන්ය. ඒ එකම කෙනා වන්නේ ඔහුයි. කොහොමනමුත්, බාබා කියා දෙනවා ඔහු පැමිණ ඔබව ඔහුට අයිති වන ආකාරය. ඔහු මෙසේ කියයි මා ඔබේ පියාය. එමනිසා, මා මොහුගේ ශරීරයෙන් රුකුලක් ගනී. එනයින්, බ්‍රහ්මා මගේ භාර්යාව වගේම දරුවාද වෙයි. ශිව බාබා ඔහු මඟින් ඔබව හදා ගන්නා අතර එවිට ඔහු ජ්‍යෙෂ්ඨ මවද වෙයි. ඔහුට කියා මවක් නැත. සරස්වතී හඳුන්වනුයේ ජගත් මාතාව කියාය. ඔබ සැම බලා කියා ගැනීමට ඔහු ඇයව පත් කරයි. සරස්වතී ඥානයේ දෙවඟනයි. ඇය කණිෂ්ඨ මවයි. මේවා ඉතා ගැඹුරු කාරණාය. ඔබ දැන් ඉගෙන ගන්නේ මේ ගැඹුරු අධ්‍යයනයයි. ඔබ ගෞරවණීය ලෙස සමත් විය යුතුයි. ඉහළම ශිෂ්‍යත්වය ලැබුණේ ඔවුන් සැමටය. ඔවුන්ට දඬුවම් විඳීමට නැත. පරම පියා මෙසේ කියයි හැකි තාක් මාව සිහි කරන්න. භාරතයේ පුරාණ යෝගාව මෙයයි. පරම පියා මෙසේ කියයි මම ඔබට වේද සහ ආගමික ග්‍රන්ථ වල සාරය කියා දෙමි. ඔබට ඉහළ ආනිසංසයක් ලැබෙන රාජයෝගා ඉගැන්වීම්. එහි පොත් පත් ආදිය නැත. එම ඥානය අතුරුදහන් වූ පසු අනාදිමත් කාලයක් දිගටම එය පැමිණියේ කෙසේද? ඉස්ලාම්, බෞද්ධ ආදී අගම් අතුරුදන් වන්නේ නැත. එය පටන් ගත් දා සිට දිගටම තිබේ. හැම කෙනාම එය දනී. කොහොමනමුත්, පරම පියා මෙසේ කියයි කිසි කෙනෙකුට මා දෙන ඥානය දිය නොහැකියි. භාරතය අසතුටට පත් වේ. මා පැමිණ එය නිරන්තර සතුටට පත් කරවයි. පරම පියා මෙසේ කියයි මම සිටින්නේ සාමාන්‍ය ශරීරයකය. ඔබේ බුද්ධියේ යෝගාව පරම පියා සමඟම තිබිය යුතුයි. ජීවාත්ම සත්තාවන්ගේ පියා වන්නේ පරම පියා පරමාත්මයයි. ඔහු දරුවන් සැමගේ පියා වන්නා සේම සැම දෙන ඔහුගේ දරුවන්ය. මෙකල සියලු ජීවාත්ම සත්තාවන් අපිරිසිඳුය. පියා මෙසේ කියයි මා මෙහි පැමිණ ඇත්තේ ප්‍රායෝගිකවයි. විනාශය අත ළඟය. ඔබ දන්නවා ගින්නක් ඇවිළුණු විට හැම කෙනෙකුගේම ශරීරය ඉන් දැවී යයි. සියලු ජීවාත්ම සත්තාවන් නැවත නිවස බලා යා යුතුය. බ්‍රහ්ම් දාතුවට ඇතුළු වීමක් හෝ ආලෝකය කරා යෑමක් නොමැත. බ්‍රහ්ම් සමාජයේ අය ආලෝකය දක්වා එයට බ්‍රහ්ම් සිද්ධස්ථානය යැයි කියයි. ඇත්ත කතාව නම්, සියලු ජීවාත්ම සත්තාවන් සිටිනා බ්‍රහ්ම් දාතුව තිබේ. පළමුව අපේ සිද්ධස්ථානය ඇත. පිරිසිඳු ජීවාත්ම සත්තාවන් එහි සිටී. මනුෂ්‍යයින් මේවා තේරුම් ගන්නේ නැත. ඥාන සාගරය වන පරම පියා මෙහි සිට ඔබ දරුවන්ට විස්තර කර දෙනවා ඔබ ඥානයේ දෙවිවරු බවත් ඉන්පසු රාජ් රාජේෂ්වර (කුමරුන් සහ කුමරියන්) වන බවත්. ඔබේ බුද්ධියේ තිබෙනවා පාරිශුද්ධකරුවාණන් වන අපේ මහා ආදරවන්ත බාබා පැමිණ දෙව්ලොව උරුමය අපට දෙන බව. මෙය සමහර අයගේ බුද්ධියට ඇතුළු නොවේ. මෙහි බොහෝ දෙනා සිටියත් එක්කෙනෙකුගේවත් බුද්ධියේ 100% ක ශ්‍රද්ධාවක් නැත. සමහරුන්ට 80% ක් හා ඇතැම් අයට 50% ක් ඇති අතර තවත් අයට එතරම් නොවේ! ඔවුන් මුළුමනින්ම අසමතුන් වෙයි! එය නියතයෙන්ම අනුපිළිවෙළිනි. බොහෝ අයට කිසිඳු ශ්‍රද්ධාවක් නැත. ඔවුන් ඒ සඳහා උත්සාහ කරයි. හොඳයි ඔවුන්ට ශ්‍රද්ධාවක් ඇති වුවත් මායා බලවත් නිසා බාබා ඔවුන්ට අමතක වෙයි. මේ බ්‍රහ්මා ද කියන්නේ ඔහු තද භක්තිවන්තයෙක්ව සිටි බවයි. ඔබ වගේම ඔහුද උපත් 63 ක් තුළ භක්ති කර ඇත. ඔබද උපත් 63 ක් භක්ති කර ඇත. ඔබ උපත් 21 කට සතුට ලැබූ අතර ඉන්පසු භක්තිවන්තයින් විය. භක්තියට පසුව ඇත්තේ, එම අරුචියයි. සන්‍යාසීන් ද මෙම වචන භාවිතය මෙසේ කරයි ඥානය, භක්තිය සහ කලකිරීම. ඔවුන් කලකිරෙන්නේ ඔවුන්ගේ ගෙවල් සහ පවුල් ගැනයි. එය සීමිත කලකිරීමක් වන අතර ඔබේ අතහැරීම අසීමිතය. සන්‍යාසීන් ගෙවල් අතහැර කැලයට යයි. දැන් නම් කැලයේ කිසිවෙක් නැත. ගුහාවල් ද හිස්ය. මක් නිසාද, ඔවුන් පළමුව සතෝප්‍රධාන් ව සිට දැන්

තමෝප්‍රධාන් බවට පත් වී ඇති නිසාය. දැන් ඔවුන්ට කිසිඳු ශක්තියක් නැත. ලක්ෂ්මී සහ නාරායන රජදහනේ දී ඔබට ශක්තිය තිබුණි. බලන්න නැවත ඉපදීමෙන් පසු ඔබ පැමිණ ඇති තැන. කිසිඳු ශක්තියක් නැත. දැන් රජයන් කියන්නේ ඔවුන් ආගම විශ්වාස නොකරන බවයි. ආගම් තුළින් බොහෝ හානි සිදු වී ඇත. ඔවුන් දිගටම භේද භින්න වෙමින් ආගම් සමගි කිරීම සඳහා සම්මන්ත්‍රණ පවත්වයි. කොහොමනමුත්, ඔවුන්ගෙන් අසන්න සමගි වන්නේ කොහොමද කියා! හැම කෙනාම දැන් ආපසු ගෙදර යමින් සිටී. බාබා පැමිණ ඇති අතර මේ ලෝකය සොහොන් පිටියක් බවට පත් වී ඇත. මෙය විවිධත්වයේ ගසයි. එය එකක් බවට පත් විය හැකිද? ඔවුන් කිසිවක් තේරුම් ගන්නේ නැත. භාරතයේ එකම ආගමක් තිබෙන කළ ඔවුන් හැඳින්වූයේ නොබෙදුනු උපදෙස් පිළිපදින දෙවි දේවතාවන් ලෙසයි. ද්විත්වය හෙවත් දෙකක් නම් එහි තේරුම යක්ෂයෝ යන්නයි. බාබා මෙසේ කියයි ඔබේ ආගම බොහෝ සතුට දෙන දෙයකි. ඔබ දන්නවා ඔබ උපත් 84 ක් ගත යුතු බව. ඔබ උපත් 84 ක් ගෙන ඇති බව පැහැදිලි වේ. අපි ආපසු ගොස් නැවත මෙහි ආ යුතුය. භාරතයේ ඔබට විස්තර කර දී තිබෙනවා ඔබ උපත් 84 සම්පූර්ණ කර ඇති බව. මේ ඔබේ බොහෝ උපත් වල අන්තිම එකයි. මෙය විස්තර කර දෙන්නේ ඔබ එක්කෙනෙකුට නොව මුළු පාණ්ඩව හමුදාවටයි. දැන් කෞරවයින්ට හෝ පාණ්ඩවයින්ට රජදහනක් නැත. ඔබ යටත් වැසියන් වන අතර ඔවුන් ද යටත් වැසියන්ය. කෞරවයින් නිසා පාණ්ඩවයින් සොයුරන් වන අතර පාණ්ඩවයින් පැත්තේ පරමපිතා පරමාත්මා සිටින බව කියැවේ. මායා ජයගන්නා ආකාරය උගන්වන්නේ පරම පියා පැමිණි විට පමණි. ආදී සනාතන දේවි දේවතා ධර්මයට අයත් ඔබ ප්‍රචණ්ඩත්වයෙන් තොරය. එය උත්තරීතර ආගමයි. ප්‍රධාන කාරණය වන්නේ රාග කඩුව පාවිච්චි නොකිරීමයි. භාරතයේ මිනිසුන් විශ්වාස කරන්නේ එළදෙනුන් ඝාතනය නොකිරීම පමණක් ප්‍රචණ්ඩත්වයෙන් තොර වීම ලෙසයි. කොහොමනමුත්, බාබා මෙසේ කියයි කාම රාග කඩුව පාවිච්චි නොකරන්න. ඉහළම ප්‍රචණ්ඩත්වය එයයි. සත් යුගයේදී රාග කඩුව හෝ කිසිම සටනක් නැත. ඒ සියල්ල ඇත්තේ මෙහිය. රාග කඩුව මුල, මැද, අග තුනේදීම දුක උපදවයි. ඔබ ඉණිමගේ පහළට බසී. භාරතයේ මිනිසුන් උපත් 84 ම ගෙන ඇත. ලක්ෂ්මී සහ නාරායන නැවත නැවත උපදියි. හැම උපතක් ම ඉණිමගේ එක හිණිපෙතක් වෙයි. මෙහි සිට ඔබ එක පිම්මකින් ඉහළටම පනී. හිණිපෙත් 84 ක් බහින්නට අවුරුදු 5000 ක් යන අතර ඉහළට යාමට ගන්නේ තත්පරයක ඇසිල්ලකි. කවුද ඔබට ජීවන මුක්තිය ඇසිල්ලකින් ලබා දුන්නේ? පරම පියාය. හැම කෙනෙක්ම දැන් පහළටම වැටී ඇත. පරම පියා මෙසේ කියිය මා පමණක්ම සිහිකරන්න. ඔබේ බුද්ධිය දැන් සිහිකළ යුතුයි, නාටකය අවසන් බවත් අප නැවත ගෙදර යා යුතු බවත්. පරම පියාත් ගෙදරත් සිහිකළ යුතුයි. පළමුව පරම පියා සිහිකරන්න. එවිට ඔහු ඔබට ගෙදරට පාර කියා දෙයි. පරම පියා සිහි කිරීමෙන් ඔබේ පාප දැවී යයි. බ්‍රහ්ම දාතුව සිහිකිරීමෙන් එක පාපයක් වත් දැවී නොයයි. පාරිශුද්ධකරුවාණන් වන්නේ පරමාත්මය පමණි. ලෝකයේ කිසිවෙක් ඔහු පිරිසිඳු කරන ආකාරය තේරුම් නොගනී. පරම පියා දෙව්ලොව නිමවීමට නියතයෙන්ම පැමිණිය යුතුය. පරම පියා පැමිණ ඇති අතර ඔබ දරුවන් ඔබේ උපන් දිනය සමරයි. ඔබට හරියටම කිව නොහැකියි ඔහු එන මොහොත, වේලාව සහ දිනය. ශිව බාබා ආවේ එවිට දැයි ඔබ කියන්නේ කෙසේද? බොහෝ අය දසුන් දකී. පළමුව අප ඔහු සර්ව ව්‍යාපී බව හෝ ජීවාත්ම සත්තාව පරමාත්මය ලෙස සිතුවා. දැන් අපි නිවැරදිවම දකී. බාබා දිනපතාම දිගටම අපට ගැඹුරු දේ කියා දෙයි. ඔබ සාමාන්‍ය දරුවන් එතරම්ම උසස් ඥානයක් උගනී! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ගෞරවයෙන් සමත් වීමට නම්, දඬුවමින් නිදහස් වීමට උත්සාහ කරන්න. ස්මෘතියෙන් සිටීම මගින් පමණක් ම ශිෂ්‍යත්වයට හිමිකම් කිව හැකිය.
2. සැබෑ පාණ්ඩවයෙක් බවට පත් වී හැම කෙනෙක්ම ආධ්‍යාත්මික වන්දනාවේ ගෙන යන්න. කිසිම ආකාරයක ප්‍රචණ්ඩත්වය නොකරන්න.

**වරදානය:** ඔබ ප්‍රදීපාගාරයක අවධියෙන් පුණ්‍ය ජීවාත්මයක් වී, එමගින් පාපකාරී ක්‍රියා කිරීම නවත්වන්න.

ආලෝකය ඇති තැන, කිසිඳු පාපකාරී ක්‍රියාවක් තිබිය නොහැක. ඔබ නිරන්තරයෙන්

ප්‍රදීපාගාරයක අවධියෙන් සිටීමෙන්, මායාට ඔබට කිසිදු පාප ක්‍රියාවක් කිරීමට සැලැස්විය නොහැක, මන්ද ඔබ නිරන්තරයෙන් පුණ්‍ය ජීවාත්මයක් බවට පත්වී ඇති නිසා. පුණ්‍ය ජීවාත්මයකට ඔහුගේ සිතුවිලි තුළ පවා කිසිදු පාප ක්‍රියාවක් කළ නොහැක. පාපය ඇති තැන, පියාගේ ස්මරණය තිබිය නොහැක. මෙම අධිෂ්ඨානශීලී සිතුවිල්ල තබා ගන්න: මම පුණ්‍ය ජීවාත්මයක් වන අතර පාපය මා ඉදිරියට පැමිණිය නොහැක. ඔබේ සිහින හෝ සිතුවිලි වලට කිසිදු පාපයක් ඇතුළු වීමට ඉඩ නොදෙන්න.

**පාඨය:** නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස සෑම දර්ශනයක්ම නිරීක්ෂණය කරන අය නිරන්තරයෙන් ප්‍රීතිමත්ව සිටිති.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

බුද්ධියෙ විශ්වාසය ඇති දරුවන් නිරන්තරයෙන් ප්‍රීතියෙන් හා බාධක වලින් නිදහස්ව සිටිති. කනස්සල්ල ඔබේ සතුට අවසන් කරයි, නමුත් ඔබ බාධක වලින් නිදහස් නම්, නිරන්තරයෙන් සතුටින් සිටී. ඔබ ප්‍රශ්න අසන විට: "මොකද වුණේ?" "එය සිදු වූයේ කෙසේද?" "කුමක් සිදුවේද?" ඕනෑම තත්වයකදී, කනස්සල්ලක් ඇත. ඇයි? මොකක්ද? සහ කෙසේද? කනස්සල්ලේ රැළි. සමහරු එවිට මෙසේ කියති: "මට මෙය සැමවිටම සිදුවන්නේ ඇයි?" "මට මේ සියලු බැඳීම් ඇත්තේ ඇයි?" "මායා මා පසුපස එන්නේ ඇයි?" "මගේ කර්ම ගිණුම් මෙතරම් දරුණු වන්නේ ඇයි?" එබැවින් "ඇයි?" යනුවෙන් විමසීම යන්නෙන් අදහස් කරන්නේ කනස්සල්ලේ රැළි ඇති වීමයි. මෙම කරදර වලින් නිදහස් වූ අය සැමවිටම බාධක වලින් මිදී සිටියි.